# දේශීය කැඩුම් බිඳුම් වෙදකමට උරදෙන කොත්මලේ වෙද පරම්පරාව

වෛද්‍ය කේ.ජී.යූ.ඩබ්.කොන්දසිංහ, වෛද්‍ය එච්.ඒ.ආර්.පී.පෙරේරා

සිංහල ජාතිය සතු ප්‍රෞඪත්වය සහ අභිමානය ඔප් නැංවීමට ඉවහල් වූ සුවිශේෂී කාරණා අතර දේශීය වෛද්‍ය ඥානය ප්‍රමුඛස්ථානයේ ලා සැලකිය හැකිය. ශ්‍රී ලංකාව පිළිබඳ රොබට් නොක්ස් විසින් රචිත එදා හෙළදිව නැමැති ශ්‍රේෂ්ඨ කෘතිය ඊට හොඳම සාක්ෂි සපයයි. රොබට් නොක්ස් තමා විසින් ලද අත්දැකීම් සමුදායක් පිළිබඳ ඉතා සියුම් ව සඳහන් කර ඇති එම ග්‍රන්ථයේ "මේ රටේ හැමෝම වෙද්දු" යනුවෙන් ලියා තිබීම එදා සිංහල ජාතිය සතුව පැවති වෛද්‍ය ඥානය මිනිය හැකි මිනුම් දණ්ඩක් ලෙස සැලකීම වුව ද වරදක් නැත. එදා සිට මේ දක්වා පරපුරෙන් පරපුරට පැවත ආ එම සුවිශේෂී වෛද්‍ය ක්‍රමයන් වර්තමානය වන විට ශේෂ වී යෑමේ තර්ජනයකට ලක්ව තිබීම සැබවින්ම ශෝකජනකය.

දේශීය වෛද්‍ය ක්‍රමය සතුව පැවති, විශිෂ්ට අංග ලෙස කැඩුම් බිඳුම්, දෑවුම් පිළිස්සුම්, විදුම් පිළිස්සුම් ගෙඩි, වණ පිළිකා ඇස් වෙදකම, විෂ වෙදකම, නිල වෙදකම, කුඩලු වෙදකම, උන්මාද, අපස්මාර, භූත දෝෂ සඳහා විශේෂ ප්‍රතිකාර ක්‍රම යනාදිය සඳහන් කළ හැක. මෙම අංග අතුරින් කැඩුම් බිඳුම් වෙදකමට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ඈත අතීතයේ සිටම විවිධ කැඩුම්- බිඳුම් වෙද පරම්පරා සතුව තිබූ සුවිශේෂී හැකියාවන් නිසා ම දේශීය කැඩුම්- බිඳුම් වෙදකම දිනෙන් දින දියුණු වෙමින් අද දක්වා සාර්ථක ගමනක් පැමිණ තිබේ.

මිනිසාට එදිනෙදා ජන ජීවිතයේ දී බොහෝ විට කැඩීම් බිඳීම් තත්ත්වයනට මුහුණ පෑමට සිදුවීමේ ප්‍රවණතාවය වැඩි වීමත්, අස්ථි හා සන්ධි ආශ්‍රිත විකෘතියකදී බටහිර ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසුව රෝගීන්ට ඇතැම් විට අනිසි උපද්‍රව ඇතිවන නිසාත්, ගස්වැල් කොළ පොතු උපයෝගී කර ගත් ස්වභාව ධර්මය හා බැඳුනු සරල ප්‍රතිකාර පද්ධතියකින් යුත් දේශීය කැඩුම් බිඳුම් ප්‍රතිකාර ක්‍රමයට ජනතාව වැඩි වැඩියෙන් නැඹුරු වීම කැඩුම් බිඳුම් අංශය අද දක්වා පැවත ඒමට මූලික වූ හේතු -සාධක ලෙස සැලකිය හැකිය.

කොත්මලේ කැඩුම්- බිඳුම් වෙද පරම්පරාව ද තම සුවිශේෂී හැකියාවන් පරපුරෙන්, පරපුරට ගෙන යමින් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන වෙද පරම්පරාවකි. එම වෙද පරම්පරාව සතු මා හැඟි උරුමයන් අතර කැඩුණු අස්ථිය දින 14කින් පෑස්සීමත්, භග්නයෙහි අතුරු උපද්‍රවයක් ලෙස ඇතිවන සන්ධි තද වීම (ස්ථබ්ධතාවය) යථා තත්ත්වයට ඉතා ඉක්මනින් ගෙන ඒමත් සඳහන් කළ හැකිය. එමෙන්ම අස්ථි සන්ධි ආශ්‍රිත ව සිදුවන ඇට කැඩීම්, ඇට පැනීම්, ඇඹරීම්, කෙටීම්, උළුක්කුවීම්, පෙරලීම්, තැලීම්, අවහන්දි වීම් ආදි ඕනෑම විකෘතිතාවයකට ඉතා ඉක්මණින් සුවය ලබා දීමේ හැකියාව මෙම පරම්පරාව සතු වේ.

කොත්මලේ වෙද පරම්පරාවේ බහුල ව යොදා ගන්නා ඖෂධ අතර හික් කොළ පොතු, කොබ්බෑ කොළ පොතු, කැටකෑල කොළ පොතු, හාතාවාරිය කොළ, කරඳ පොතු, තොලබෝ අල වැනි ඖෂධීය ශාක වර්ග ද මී තෙල්, එඬරු තෙල්, තල තෙල් වැනි තෛල වර්ග ද සුසංයෝගයෙන් සාදා ගන්නා මැල්ලුම්, පත්තු, තැවිලි යෙදීමෙන් ද ද්‍රව්‍ය 38 කින් සමන්විත වූ තමා විසින් ම සකසා ගන්නා කැඩුම් බිඳුම් තෙල අභ්‍යංගය සඳහා යොදා ගැනීමෙන් ද ඒ ඒ සන්ධි අස්ථි වලට අනුකූල ව හා සිදුව තිබෙන විකෘතියේ ස්වභාවයට අනුකූල ව පැලැස්තර යෙදීම, වෙලීම, පතුරු තබා බැඳීම පිළිබඳ ඔවුන් සතු විශේෂ දැනුම් සම්භාරය ද රෝගීන්ට ඉක්මන් සුවය සැලසීමට ඉවහල් වේ.